# මාසික වෙළඳ විවරණිකාව

## ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා මහ බැංකුව

**2022 දෙසැම්බර්**
**04 වෙළුම 12 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය




### මාසික ආනයන ක්‍රියාකාරිත්වය




2022 වසරේ දෙසැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,068ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 7.7කින් පහළ ගියේය.

2022 වසරේ දෙසැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,426ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 36.4කින් පහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)




2022 වසර තුළ දී පෙර වසරට සාපේක්ෂව අපනයන ආදායම සියයට 4.9කින් ඉහළ ගිය අතර, ආනයන වියදම සියයට 11.4කින් පහළ ගියේය.

වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 1,085ට සාපේක්ෂව 2022 දෙසැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 358ක් දක්වා පහළ ගියේය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2022 ජන.- දෙසැ.)

| අපනයන (එ.ජ. ඩොලර් මිලියන) | | ආනයන (එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---|---|---|
| රෙදිපිළි හා ඇඟලුම් | 5,952.0 | 4,896.8 | ඉන්ධන |
| තේ | 1,258.8 | 3,065.2 | රෙදිපිළි හා රෙදිපිළි උපාංග |
| රබර් නිෂ්පාදිත | 977.0 | 1,969.0 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 580.9 | 966.2 | රසායනික නිෂ්පාදිත |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 568.0 | 926.3 | ගොඩනැගිලි ද්‍රව්‍ය |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 519.5 | 650.8 | ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 450.6 | 533.4 | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත |
| පොල් | 400.3 | 465.9 | කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත |
| කුළුබඩු | 368.7 | 430.5 | ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත |
| මුහුදු ආහාර | 269.0 | 334.7 | රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත |

# අපනයන ක්‍රියාකාරිත්වය

## අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.- දෙසැ.)




## අපනයන පරිමා හා මිල දර්ශක (ජන.- දෙසැ.)




2022 වසර තුළ දී, ප්‍රධාන වශයෙන් කාර්මික සහ ඛනිජමය නිෂ්පාදිත අපනයන ඉහළ යෑම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය. ඊට ප්‍රතිවිරුද්ධව, කෘෂිකාර්මික අපනයන පහළ යෑමක් වාර්තා කළේය.

2022 වසර තුළ දී, අපනයන පරිමා දර්ශකය සහ අපනයන මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 1.9කින් සහ සියයට 2.9කින් ඉහළ ගියේය.

# කෘෂිකාර්මික අපනයන

## කෘෂිකාර්මික අපනයන ආදායම




## කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.- දෙසැ.)




## තේ සහ රබර් මිල ගණන් *




*2022 වසරේ ජූලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත

2022 වසර තුළ දී ප්‍රධාන වශයෙන් කුළුබඩු, තේ සහ පොල් ආශ්‍රිත නිෂ්පාදිත ඇතුළු බොහෝ කෘෂිකාර්මික භාණ්ඩවල අපනයන ආදායම සමස්තයක් ලෙස පහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත ඉහළ අපනයන ආදායම් වාර්තා කළේය.

# කාර්මික අපනයන

## කාර්මික අපනයන ආදායම




## කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)




## නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්




2022 වසර තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මෙම වසර තුළ රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග සහ දුම්කොළ, ප්‍රවාහන උපකරණ සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

## ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.- දෙසැ.)




## ආනයන පරිමා හා මිල දර්ශකය (ජන.- දෙසැ.)




ප්‍රධාන වශයෙන්, ආයෝජන සහ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසර තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව පහළ ගියේය. එසේ වුවත්, මෙම වසර තුළ දී, අන්තර් භාණ්ඩ ආනයන මත වියදම සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, පෙර වසරට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සියයට 22.4කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 14.1කින් ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන

### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම




### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-දෙසැ.)




### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය




ප්‍රධාන වශයෙන්, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, විදුලි සංදේශ උපකරණ සහ ගෘහ උපකරණ ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසර තුළ දී, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව පහළ ගියේය. තවද, ආහාර හා පාන වර්ග කාණ්ඩය යටතේ වර්ග කරන තෙල් හා මේද වර්ග, කිරි නිෂ්පාදිත සහ එළවළු ආනයන වියදමෙහි පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, 2022 වසර තුළ දී ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, සහල්), පාන වර්ග සහ කුළුබඩු සඳහා වන ආනයන වියදම් ඉහළ අගයක පැවතිණි.

# අන්තර් භාණ්ඩ ආනයන

### අන්තර් භාණ්ඩ ආනයන වියදම




### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



### අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- දෙසැ.)




### බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)




*2021 වසරේ මාර්තු, ජූනි,සැප්තැම්බර්, නොවැම්බර් මාසවල සහ 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි, ජූලි සහ ඔක්තෝබර් මාසවල බොරතෙල් ආනයනය කර නැත.

ප්‍රධාන වශයෙන්, ඉන්ධන, පොහොර සහ දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසර තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, 2022 වසර තුළ මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ හා වානේ), තිරිඟු ඇට, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන

### ආයෝජන භාණ්ඩ ආනයන වියදම




### ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- දෙසැ.)




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසර තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | දෙසැ.- 2021 | දෙසැ.- 2022 | වෙනස (%) | ජන. - දෙසැ. 2021 | ජන.- දෙසැ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **232.3** | **203.4** | **-12.4** | **2,729.5** | **2,568.0** | **-5.9** |
| එයින් | තේ | 110.6 | 107.3 | -3.0 | 1,324.4 | 1,258.8 | -5.0 |
| | පොල් | 31.4 | 24.8 | -21.0 | 425.2 | 400.3 | -5.9 |
| | කුළුබඩු | 43.7 | 31.3 | -28.2 | 454.8 | 368.7 | -18.9 |
| | මුහුදු ආහාර | 26.7 | 21.3 | -20.0 | 274.1 | 269.0 | -1.8 |
| **කාර්මික අපනයන** | | **916.7** | **840.9** | **-8.3** | **9,702.0** | **10,465.3** | **7.9** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 533.2 | 481.5 | -9.7 | 5,435.1 | 5,952.0 | 9.5 |
| | රබර් නිෂ්පාදිත | 90.3 | 71.2 | -21.1 | 1,050.4 | 977.0 | -7.0 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 51.0 | 49.4 | -3.1 | 506.4 | 568.0 | 12.2 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 57.4 | 36.7 | -36.0 | 586.9 | 519.5 | -11.5 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 43.2 | 50.5 | 16.9 | 500.9 | 580.9 | 16.0 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 23.2 | 35.3 | 51.8 | 276.7 | 450.6 | 62.8 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 6.4 | 7.4 | 16.5 | 58.4 | 85.8 | 46.9 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **7.3** | **23.3** | **220.2** | **67.1** | **73.2** | **9.1** |
| **මුළු අපනයන** | | **1,156.3** | **1,067.6** | **-7.7** | **12,498.6** | **13,106.4** | **4.9** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | දෙසැ.- 2021 | දෙසැ.- 2022 | වෙනස (%) | ජන. - දෙසැ. 2021 | ජන.- දෙසැ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **419.3** | **241.5** | **-42.4** | **3,848.7** | **2,813.0** | **-26.9** |
| **ආහාර හා පාන වර්ග** | | 171.2 | 129.9 | -24.1 | 1,666.5 | 1,607.9 | -3.5 |
| එයින් | එළවළු (ආ) | 33.2 | 21.3 | -36.0 | 384.3 | 318.4 | -17.1 |
| | සහල් | 49.0 | 8.3 | -83.0 | 73.0 | 292.5 | 300.5 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 248.1 | 111.6 | -55.0 | 2,182.2 | 1,205.1 | -44.8 |
| එයින් | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 128.5 | 57.8 | -55.0 | 882.5 | 533.4 | -39.6 |
| **අන්තර් භාණ්ඩ** | | **1,368.3** | **983.8** | **-28.1** | **12,308.9** | **12,438.8** | **1.1** |
| එයින් | ඉන්ධන | 442.5 | 383.5 | -13.3 | 3,742.9 | 4,896.8 | 30.8 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 297.9 | 200.9 | -32.6 | 3,066.9 | 3,065.2 | -0.1 |
| | පොහොර | 36.9 | 115.8 | 213.8 | 158.2 | 275.9 | 74.4 |
| | තිරිඟු හා ඉරිඟු | 30.2 | 35.8 | 18.5 | 418.3 | 303.1 | -27.5 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **453.4** | **200.2** | **-55.8** | **4,479.8** | **3,039.2** | **-32.2** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 307.7 | 130.0 | -57.8 | 2,809.5 | 1,969.0 | -29.9 |
| **මුළු ආනයන** | | **2,241.0** | **1,425.6** | **-36.4** | **20,637.4** | **18,291.0** | **-11.4** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | දෙසැ.- 2021 | දෙසැ.- 2022 | වෙනස (%) | ජන. - දෙසැ. 2021 | ජන.- දෙසැ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -1,084.7 | -358.0 | | -8,138.8 | -5,184.6 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | දෙසැ.- 2021 | දෙසැ.- 2022 | වෙනස (%) | ජන. - දෙසැ. 2021 | ජන.- දෙසැ. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 160.9 | 148.6 | -7.7 | 145.0 | 152.0 | 4.9 |
| | පරිමා දර්ශකය | 169.0 | 171.3 | 1.3 | 156.9 | 159.9 | 1.9 |
| | මිල දර්ශකය | 95.2 | 86.8 | -8.9 | 92.4 | 95.1 | 2.9 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 200.6 | 127.6 | -36.4 | 153.9 | 136.4 | -11.4 |
| | පරිමා දර්ශකය | 201.3 | 121.8 | -39.5 | 162.2 | 126.0 | -22.4 |
| | මිල දර්ශකය | 99.6 | 104.8 | 5.1 | 94.9 | 108.3 | 14.1 |
| **වෙළඳ මිල අනුපාතය** | | 95.5 | 82.8 | -13.3 | 97.4 | 87.8 | -9.9 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද

ජාත්‍යන්තර වෙළඳාම සහ වෙළඳ භාණ්ඩ අධ්‍යයන අංශය /ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව